# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 197/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 03/02/2024
පැය 2230

**මාධ්‍ය නිවේදනය**

**2024 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට නියමිත සියළුම පොලිස් නිලධාරීන්ගේ හා සිවිල් කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ දරුවන්ට මුදල් වවුචර් පත් ලබා දීම - පොලිස් සුභසාධක කොට්ඨාසය.**

2024 වර්ෂයේ පාසල් වල පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට නියමිත සියළුම තරාතිරම් වල පොලිස් නිලධාරීන් සහ ශ්‍රී ලංකා පොලිසියේ සිවිල් කාර්ය මණ්ඩලයේ නිලධරයන්ගේ දරුවන්ට පාසල් බෑගයක් සහ සපත්තු යුගලක් මිලදී ගැනීමට අවශ්‍ය මුදල් වවුචර්පත් ප්‍රදානය කිරීමේ සමාරම්භක උත්සවය 2024.02.03 වන අද දින සවස් කාලයේ දී වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් පිටකෝට්ටේ සෝලිස් උත්සව ශාලාවේ දී පවත්වන ලදී.

මෙම අවස්ථාවේදී ගල්කිස්ස හා නුගේගොඩ කොට්ඨාසවල පොලිස් නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකා පොලිසියේ සිවිල් කාර්ය මණ්ඩලයේ නිලධරයන්ගේ දරු දැරියන් 84 දෙනෙකුට වැඩබලන පොලිස්පති තුමා විසින් සංකේතාත්මක වවුචර් පත් ප්‍රදානය කරන ලදී. මෙම වැඩසටහන 2024 වසර තුල ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රුපියල් ලක්ෂ 184 ක් වෙන් කර ඇත. මෙහි දී වැඩබලන පොලිස්පතිතුමන් විසින් **“මෙම වැඩ සටහන වාර්ෂිකව සිදුකරන වැඩසටහනක් ලෙස ඉදිරියට කර ගෙන යන බවත්, පළමු වසරේ අධ්‍යාපනය ලැබීමට පාසල් වලට ඇතුලත් වන දරු දැරියන් සඳහා අවශ්‍ය පොත්පත්ද ලබන වසරේ සිට ලබා දෙන බවට”** ප්‍රකාශ කරන ලදී.

එම අවස්ථාවට බස්නාහිර පළාත් දකුණ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජී.එච්. මාරපන, පොලිස් සුභසාධන හා වෛද්‍ය සේවා දිසාව භාර කාන්තා නියෝජ්‍ය පොලිස්පති ඩබ්ලිව්.ජේ. පද්මිණී, පොලිස් සුභසාධන කොට්ඨාසය භාර ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී එල්.එම්. සංජීව බණ්ඩාර, ගල්කිස්ස කොට්ඨාස භාර ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී මංගල දෙහිදෙණිය, නුගේගොඩ දිස්ත්‍රික් 01 භාර පොලිස් අධිකාරී එච්.ඩී.එච්. තුසිත කුමාර යන මහත්ම මහත්මීන් ඇතුළු පොලිස් නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් පිරිසක් සහභාගී වූහ.

ඡායාරූප




PMD






මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.